DOI : 10.31357/fhssmst.2006.00662

# පාසල් නොයන ළමුන් ප්‍රධාන සමාජ ප්‍රවාහයට අනුගත කිරීම පිළිබඳ සමාජ විද්‍යාත්මක විමර්ශනයක්

(කොළඹ දිස්ත්‍රික්කයේ නුගේගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් 514 සී ඔබේසේකරපුර ග්‍රාම නිලධාරී වසම ඇසුරින්)

ශාස්ත්‍රපති සමාජ විද්‍යා උපාධිය සඳහා ඉදිරිපත් කෙරෙන පර්යේෂණ නිබන්ධය

ජී.සුධර්මා ප්‍රියන්ති

සමාජ විද්‍යා හා මානව විද්‍යා අධ්‍යයනාංශය

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

ගංගොඩවිල

නුගේගොඩ

## පර්යේෂකයාගේ ප්‍රකාශය

**"පාසල් නොයන ළමුන් ප්‍රධාන සමාජ ප්‍රවාහයට අනුගත කිරීම පිළිබඳ සමාජ විද්‍යාත්මක විමර්ශනයක්"** නැමැති මාතෘකාව යටතේ සමාජ විද්‍යා ශාස්ත්‍රපති උපාධි පරීක්ෂණය සඳහා මෙම නිබන්ධය ඉදිරිපත් කරමි. මෙය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සමාජ විද්‍යා හා මානව විද්‍යා අධ්‍යයනාංශයේ මහාචාර්ය දයලාල් අබේසේකර මහතාගේ උපදේශකත්වය මත මවිසින් ඉදිරිපත් කෙරෙන ස්වාධීන පර්යේෂණ නිබන්ධයකි.

.........................................................

ජී.එස්.ප්‍රියන්ති

## උපදේශකතුමාගේ ප්‍රකාශය

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සමාජ විද්‍යා ශාස්ත්‍රපති උපාධිය සඳහා ජී.එස්.ප්‍රියන්ති විසින් මාගේ උපදෙස් මත මෙම නිබන්ධය ස්වාධීන පර්යේෂණ නිබන්ධයක් ලෙස සකස් කොට ඉදිරිපත් කෙරෙන්නකි. මෙම නිබන්ධය එම උපාධි අවශ්‍යතාවය සඳහා සුදුසු බව නිර්දේශ කරමි.

..................................

මහාචාර්ය දයලාල් අබේසේකර

දිනය : 25/08/2006

25 AUG 2006

පිදුම

ජීවිත කාලය පුරා ම
ඉගෙනුමට
ශක්තිමත් පදනමක්
සැපයූ
සඳාදරණීය දෙමව්පියන් පිළිබඳ
ආදරණීය මතකයට
උපහාරයක් ලෙස
පුදන්නෙමි!

# ස්තුතිය

මෙම භාරදූර කාර්යය සඳහා මාහට නිරතුරුව ම උපදෙස් ලබා දුන් මහාචාර්ය දයලාල් අබේසේකර මහතාට ද

මෙවන් අධ්‍යයනයක් සඳහා යා යුතු මග පිළිබඳ මූලික දැනුම ලබා දුන් මහාචාර්ය නන්දසේන රත්නපාල මහතාට ද

අධ්‍යයන කාර්යය සඳහා විවිධ අවස්ථාවල දී උපදෙස් හා මග පෙන්වීම් සැපයූ මහාචාර්ය බී.ජේ.ටෙනිසන් පෙරේරා මහතාට ද

කොළඹ විශ්වවිද්‍යාලයේ සිංහල අධ්‍යයනාංශයේ මහාචාර්ය ස්වර්ණා විජේතුංග මහත්මියට සහ මහාචාර්ය රෝලන්ඩ් අබේපාල මහතාට ද

අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ නොවිධිමත් අධ්‍යාපන අංශයේ අධ්‍යක්ෂ එච්.පී.එන්.ලක්ෂ්මන් මහතා ඇතුළු කාර්යය මණ්ඩලයට ද

ශ්‍රී ජයවර්ධනපුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ හිටපු ප්‍රාදේශීය ලේකම් දමිතා අබේරත්න මහත්මියට ද

ශ්‍රී ජයවර්ධනපුර කලාප අධ්‍යාපන කාර්යාලයේ නොවිධිමත් අධ්‍යාපන අංශයේ ව්‍යාපෘති නිලධාරී චන්ද්‍රා කුලසිංහ සහ එස්.කේ.ලියනගේ යන මහත්මීන්ට ද

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පශ්චාද් උපාධි අධ්‍යයන පීඨයේ කාර්ය මණ්ඩලයට ද

මෙම කාර්යය සඳහා උදව් වූ වරලත් ගණකාධිකාරී සුනිල් කුමාර මහතාට ද

නොයෙක් රාජකාරී මධ්‍යයේ සහාය වූ ආදරණීය ස්වාමිපුරුෂයාට සහ පවුලේ සැමටත්

මගේ ගෞරව පූර්වක ප්‍රනාමය පුද කරමි.

.............................................. ජේ.එස්.ප්‍රියන්ති

..............06/08/23 දිනය

## පටුන

පිටුව


1 පරිච්ඡේදය - හැඳින්වීම නියැදිය හා ක්‍රමවේදය

1.1 හැඳින්වීම 1 - 26

1.2 අරමුණු හා පරමාර්ථ 27 - 31

1.3 නියැදිය හා ක්‍රමවේදය 31 - 40

1.4 පරිච්ඡේද විස්තර කිරීම 40 - 42

2 පරිච්ඡේදය - පාසල් නොයන ළමයින් හා අධ්‍යාපනය

2.1 අධ්‍යාපනයේ විකාශනය 43 - 69

2.2 ප්‍රාථමික අධ්‍යාපන ප්‍රවේශ අවශ්‍යතාවය හා දියුණු කළයුතු නිපුණතා 69 - 90

2.3 තුන්වන ලෝකයේ රටවල අධ්‍යාපනය තුළ මතු වී ඇති ගැටළු 90 - 105

3 පරිච්ඡේදය - ළමයින් පාසල් නොයෑමට හේතු සහ ඔවුන්ගේ ස්වභාවය

3.1 ළමයින් පාසල් නොයෑම කෙරේ බලපාන සමාජ ආර්ථික හේතු 106 - 118

3.2 වෙනත් හේතු 118 - 124

3.3 පාසල් නොයන ළමයින්ගේ ස්වභාවය 124 - 127

4 පරිච්ඡේදය - සමීක්ෂණ ප්‍රදේශය ආශ්‍රිත පාසල් නොයන ළමයින්ගේ ස්වභාවය

4.1 සමීක්ෂණ ප්‍රදේශය හඳුනා ගැනීම 128- 134

4.2 පාසල් නොයන ළමයින්ගේ ස්වභාවය 134- 160

5 පරිච්ඡේදය - පාසල් නොයන ළමයින් සඳහා ක්‍රියාත්මක වන නොවිධිමත් අධ්‍යාපන වැඩසටහන්

5.1 නොවිධිමත් අධ්‍යාපනයේ විකාශනය 161 - 170

5.2 ලංකාවේ නොවිධිමත් අධ්‍යාපන වැඩසටහන් හා සංවිධාන ව්‍යුහය 170 - 187

6 නිගමන හා යෝජනා

| | | |
|---|---|---|
| 6.1 | නිගමන | 188 - 193 |
| 6.2 | යෝජනා | 194 - 198 |
| | ආශ්‍රිත ග්‍රන්ථ | 199 - 207 |
| | උපලේඛන | 208 - 213 |

1 පරිච්ඡේදය

# හැඳින්වීම . නියැදිය හා ක්‍රමවේදය

## 1.1 හැඳින්වීම

සමාජයක පැවැත්ම හා වර්ධනය, භාෂණය හා ලේඛනය මත ගොඩ නැගුණු සන්නිවේදන රටාවකින් පෝෂණය වී ඇත. ඒ තුළින් මානව ආරක්ෂාව, පුද්ගල සංවර්ධනය හා අදහස් හුවමාරු ව රැඳී පවතී යැයි නිගමනය කළ හැකි ය. මිනිසාගේ අපූරු නිර්මාණයක් වූ භාෂාව මානවයාගේ ජීව විද්‍යාත්මක ප්‍රභවය හා නිතැතින් ම වෙලී පවතී. භාෂාව සමාජයකට අර්ථවත් ලෙස යොදා ගැනීමටත් දැනුම පරපුරෙන් පරපුරට ඉදිරියට ගෙන යෑම සඳහාත් **"අධ්‍යාපනය"** මිනිසාට අත්‍යවශ්‍ය වැදගත් සාධකයකි.

ඒ අනුව අධ්‍යාපනය මානව සමාජයේ පැවැත්මට හා සංවර්ධනයට ඉතා ප්‍රබල කාර්ය භාරයක් ඉටු කරනු ලබන බව පෙනේ. එය ළමයාගේ නෛසර්ගික අයිතියකි. ලෝකයේ ජීවත් වන සියලු ම මිනිසුන්ට අධ්‍යාපන අවස්ථා හිමි විය යුතු බව 1972 තායිලන්තයේ පැවැත් වූ **"සියලු දෙනාට ම අධ්‍යාපනය"** නැමති සම්මේලනය මගින් ද, 1984 දෙසැම්බර් 10 වන දින ප්‍රකාශයට පත් කරන ලද මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශයෙන් ද, 1990 නිව්යෝර්ක් නුවර පැවැත් වූ ළමයින් සඳහා වූ ලෝක සමුළුව මගින් ද ජාත්‍යන්තර වශයෙන් අධ්‍යාපන අයිතිය තහවුරු කර ඇත. ඉන් ගම්‍ය වන්නේ ලොව සැම දෙනාට ම අධ්‍යාපනය හිමි විය යුතු බවයි (අතුකෝරාළ හා අතුකෝරාළ1991 : 8). ඒ අනුව අද ලෝකයේ සැම රටක් ම, සැම සමාජයක් ම අධ්‍යාපනයේ අගය වටහා ගෙන සැමට අධ්‍යාපනය ලබා දීම ප්‍රධාන අපේක්ෂාවක් බවට පත් කර ගෙන ඇත.

### 1.1.1 ලොව පුරා වෙසෙන පාසල් නොයන ළමයින්ගේ ස්වභාවය .

සැමට අධ්‍යාපනය ලබා දීමේ ප්‍රතිපත්තිය තුළ ලෝකයේ සෑම රටක් ම පාහේ සාක්ෂරතාවය පිළිබඳ දක්වන උනන්දුව වැඩි වී ඇති අතර විවිධ මට්ටම්වලින් එය පෙන්නුම් කෙරේ. 2000 වසරේ මුළු ලෝක ජනගහනයෙන් 25% ක් පමණ නිරක්ෂරතාවයෙන් පෙළුන අතර, ලොව වැඩිම ජනගහන අනුපාතයක් ඇති ඉන්දියාව හා චීනය ඒ අතර ප්‍රධාන රටවල් වේ (අතුකෝරාල හා අතුකෝරාල 1991:09).

සාක්ෂරතාවය ලබා දීම මගින් රටක සංවර්ධනය හා ඉදිරි අනාගතය සඳහා කළ හැකි මෙහෙය අති විශාල ය. **"කිසි ම රටක් ස්වකීය ජනතාවට අධ්‍යාපනය ලබා දීම මගින් බංකොලොත් භාවයට පත් වී නැත"** යනුවෙන් කොන්ෆියුසියස් තුමා ප්‍රකාශ කර ඇත. අධ්‍යාපනය විවිධ පුද්ගල සමාජ ස්ථරයන් පිළිබිඹු කරන බවත් පුද්ගල චරිත සංවර්ධනයට මනා රුකුලක් ලබා දෙන බවත් පැවසේ. එය තම තමන්ගේ පුද්ගලික කැපවීම්වල ස්වභාවය අනුව දියුණු කර ගත හැකි තත්ත්වයක් ද වේ (Galappatty 1991 : 11).

මේ අනුව සැමට අධ්‍යාපනය යන සංකල්පයෙහි අවශ්‍යතාවය පැහැදිලි වන්නේ ද ඒ පසුපස ඇති අඳුරු චිත්‍රය වටහා ගත් විට ය. යුනෙස්කෝ ආයතනය දක්වන සංඛ්‍යා ලේඛන හා වාර්තාවලට අනුව නව විද්‍යාත්මක දැනුම හුවමාරු වන සන්නිවේදන ජාලා මගින් ලෝකය සමීප කරන යුගයේ අඩු තරමින් මූලික අධ්‍යාපනය (Basic Education) කරා ළඟාවීමට නොහැකි දරුවන් විශාල ප්‍රමාණයක් ලොව පුරා සිටිති. එනම් ලෝක ජනගහණයෙන් දස ලක්ෂ 900 කට පමණ සාක්ෂර හැකියාව නොමැති බවකි (අධ්‍යාපන අමාත්‍යාංශය 2002). ඊට අමතර ව දිළිඳු රටවල අධ්‍යාපනයේ ගුණාත්මක තත්ත්වය ද අයහපත් බව කියවේ.

පසුගිය දශකයේ ප්‍රාථමික අධ්‍යාපනයේ පැහැදිලි පෘථුල වීමක් දක්නට තිබුණ ද පාසැල්වලට ඇතුළත් නොවන ළමයින්ගේ සංඛ්‍යාව ද ඉහළ ගොස් ඇත. එමෙන් ම


සාක්ෂර හැකියාව නොමැති තරුණ හා වැඩිහිටියන්ගේ සංඛ්‍යාව ද ඉහළ නැග ඇත. මින් පැහැදිලි වන්නේ බොහෝ දෙනෙකුගේ මූලික ඉගෙනුම් අවශ්‍යතා සපුරාලීමක් සිදු නොවන බවයි. යුනෙස්කෝ වාර්තාවලට අනුව 1985 දී අවුරුදු 6 - 11 අතර වයසේ දරුවන්ගෙන් දශ ලක්ෂ 105 ක් පමණ පාසල්වල නොවීය. මෙම සංඛ්‍යාවෙන් 70% ක් ම ඌන සංවර්ධිත රටවල්වලින් වීමත්, එම සංඛ්‍යාවෙන් ද 60% ක් ම කාන්තාවන් වීමත් කැපී පෙනෙන තත්ත්වයකි (Unesco Regional Office 1984). එම ප්‍රවනතාවය දිගට ම පැවතුනහොත් ක්‍රි.ව. 2000 වන විට පාසල් යා යුතු වයසේ පාසල් නොයන දරුවන් බොහෝ සෙයින් ඉහළ යා හැකි බව 1985 දී යුනෙස්කෝ වාර්තාවල සඳහන් විය.

ලොව ඉතා දියුණු රටක් ලෙස ඇමරිකා එක්සත් ජනපදය හැඳින්වුව ද, එරටේ වයස අවුරුදු 17 ට වැඩි 20% ක් පමණ අසාක්ෂර බවෙන් පෙළෙති. ඇමෙරිකාවේ විරැකියාවෙන් පසු වන්නන් අතරින් 85% ක් ද සිරගත වූවන්ගෙන් 60% ද සුළු ජාතිකයන් අතරින් 40% ද ලිවීමේ හා කියවීමේ දුෂ්කරතාවලින් පෙළෙන බවත් කාර්යබද්ධ සාක්ෂරතාවය නොමැති බවත් කියවේ (Unesco Rigionsl Office 1984).

ලෝකයේ ළමුන්ගෙන් මිලියන 495 ක් පමණ පාසල තුළ වන විට සංවර්ධනය වෙමින් පවතින රටවල මිලියන 130 ක් පමණ දරුවන් පාසලින් පිටත ය. තවත් මිලියන 250 ක් ළමා ශ්‍රමිකයන් වන අතර, මිලියන 60 ක් පමණ වසරක් පාසා ළමා ගණිකාවන්, ළමා ලිංගික මෙහෙකරුවන් බවට පත් වේ (නැපැල් දෙපාර්තමේන්තුව 2002: 09).

ප්‍රස්ථාර අංක 1

සංවර්ධනය වෙමින් පවතින රටවල පාසල් නොයන ළමයින්ගේ ස්වභාවය




(නැපැල් දෙපාර්තමේන්තුව 2002 : 10)

සංවර්ධනය වෙමින් පවතින රටවල පාසල් නොයන ළමයින්ගේ ස්වභාවය ප්‍රස්ථාර අංක 1 සටහනින් පෙන්නුම් කෙරේ. කිසිදා පාසල් නොගිය ළමයින් මෙන් ම අනිවාර්ය අධ්‍යාපන වයස් සීමාව තුළ පාසලින් ගිලිහෙන ළමයින් ද මෙම පාසල් නොයන ළමයින් අතරට අයත් වේ. මොවුන්ගේ ජීවිතවල යථාර්ථය සැබැවින් ම අයහපත් ස්වභාවයක් ගන්නා බව පැහැදිලි වන තත්ත්වයකි.

ලොව විවිධ රටවල ප්‍රාථමික අධ්‍යාපනය විවිධාකාරයෙන් ලබා දේ. ප්‍රාථමික අධ්‍යාපනය ලැබිය යුතු වයස් මට්ටම්වල වෙනස් කම් ද රටින් රටට වේ. එමෙන් ම බොහෝ දියුණු වෙමින් පවතින රටවල පාසල් නොයන ළමයින්ගේ ප්‍රවනතාවය වැඩි අතර, ඒ සඳහා විවිධ හේතු බලපා ඇත. ඒ තුළ ද ප්‍රධාන වශයෙන් ආර්ථික සාධකය බලපා ඇති බව පෙනේ.

ලෝක මට්ටමින් පාසල් නොයන ළමයින්ගේ ස්වභාවය තව දුරටත් විමසා බලන විට

පාසලින් බැහැර වීම ද ප්‍රාථමික අධ්‍යාපන අවධියේ සිදුවන අයහපත් තතත්වයක් ලෙස පෙනේ. බොහෝ දුරට ළමයින් පාසල් නොයැමට බලපෑ හේතු මෙම පාසලින් බැහැරවීමේ තත්ත්වයන්ට ද හේතු වී ඇති බව විවිධ වාර්තා මගින් පෙන්වා දී ඇත. මූලික අධ්‍යාපනය ලැබිය යුතු වයසේ දරුවන් මෙසේ පාසලින් බැහැරවීම ලොව කුමන රටකට වුව ද එතරම් යහපත් තත්ත්වයක් නොවේ.

වගු අංක 1.1

ළමයින් පාසලින් බැහැරවීමේ ස්වභාවය කලාප මට්ටමින්

| කලාපය | ප්‍රාථමික පාසලට ඇතුලත් වීම (%) | 5 ශ්‍රේණියට සමත් වීම (%) |
|---|---|---|
| උප සහරානු අප්‍රිකාව | 57 | 67 |
| දකුණු ආසියාව | 68 | 59 |
| මැද පෙරදිග හා උතුරු අප්‍රිකාව | 81 | 91 |
| ලතින් ඇමෙරිකාව | 92 | 74 |
| නැගෙනහිර ආසියාව | 96 | 90 |
| කාර්මික රටවල් | 98 | 99 |

(නැපැල් දෙපාර්තමේන්තුව 2002 : 5)

මේ අනුව ළමයින් පාසලින් බැහැරවීමේ දී දකුණු ආසියාවේ හා උප සහරානු අප්‍රිකාවේ තත්ත්වය එතරම් සතුටුදායක නොවන මට්ටමක පවතින බව පෙනේ.

රටක සමාජයක පැවැත්ම එරටේ ළමා පරපුර මත රඳා පවතී. ලොව සෑම ළමයෙකු ම යතු අයිතිවාසිකම් ඇත. එය සෞඛ්‍ය සම්පන්න වීමට, ආරක්ෂා වීමට අවශ්‍ය ආහාර හා පෝෂණය මෙන් ම අධ්‍යාපනයට ද අයිතියක් ඇත. එය එසේ වුව ද ළමයින් පාසල් නොයන්නේ නම්, බහුල වශයෙන් ළමයින්ට සාක්ෂරතාවය නොමැති නම්, පීඩාවන්ට හෝ වෙනත් බේදවාචකයන්ට ගොදුරු වන්නේ නම්, එය රටක ඉදිරි ගමනට බාධකයක් වේ (සමාජ සමීක්ෂා 1994 : 11).

ලොව බොහෝ දරුවන් නිරායාසයෙන් ම පීඩාවට පත් වේ. දිනෙන් දින මන්ද පෝෂණයට ගොදුරු වන මෙහෙකාර සේවයේ යෙදවෙන ළමා ලිංගික මෙහෙකරුවන් බවට පත් වන හා වධ හිංසාවන්ට ලක් වන ළමයින් තුළින් අනාගත පරපුර මුහුණ දී තිබෙන බේදවාචකය සමාජයේ විවිධ පැති කඩවලින් පිලිබිඹු වේ (අතුකෝරාල හා අතුකෝරාල 1991).

ලොව පුරා මිලියන 250 ක් පමණ ළමයින් පූර්ණකාලීන ව හෝ අර්ධ කාලීන ව ශ්‍රම කාර්යයේ නියැලී සිටී. මොවුන්ගෙන් වැඩි පිරිසක් ජීවිතයේ කෙදිනකවත් පාසල් ගොස් නැත. මෙම ළමා ශ්‍රමිකයන් අවුරුදු 11 - 14 වයස් කාණ්ඩයට අයත් කුඩා ළමයින් වන අතර, ගැහැණු ළමුන් විශාල වශයෙන් ගෘහ සේවිකාවන් ලෙස වැඩ කරන අතර, දූෂණයට හා ළමා අපචාරවලට ද ලක් වේ. තව ද මෙම ළමයින් අතරින් වැඩි පිරිසක් අවිධිමත් කෘෂි කාර්මික කටයුතුවල වීදි වෙළඳාම හා ගෘහ සේවය සම්බන්ධ කටයුතුවල නියැලී සිටී. තවත් පිරිසක් වහල් සේවයේ, ගණිකා වෘත්තියේ හා ළමා සොල්දාදුවන් ලෙස ද යොදවා ඇත (අරම්පත්ත 1996 : 08). එපමණක් ද නොව ලෝකයේ යුධ කලාපවල පිරිමි හා ගැහැණු ළමුන් දස දහස් ගණනින් බලහත්කාර යුධ සේවයේ යොදවා ඇති බව ද විවිධ වාර්තාවලින් පෙන්වා දී ඇත. ආර්ථික වශයෙන් ක්‍රියාකාරී ළමයින්ගේ (අවුරුදු 5 - 14) ප්‍රතිශතය ඉහළ ම අගයක් ගන්නේ ආසියාවේ ය. එය 61% ක් පමණ වේ. අප්‍රිකාවේ එම තත්ත්වය 32% හා ලතින් ඇමෙරිකාවේ 7% ක් පමණවේ (අරම්පත්ත 1996). මෙවන් තත්ත්වයක් තුළ ලොව පුරා ජීවත් වන ළමයින් විශාල ප්‍රමාණයකට අධ්‍යාපනය නොලැබී ඇති බව පසක් වේ.

මෙම තත්ත්වයන් දෙස බලන විට පාසල් නොයන ළමයින් ලොව පුරා බහුල වන බව පෙනේ. අප රටේ ද පාසල් නොයන ළමයින් සැලකිය යුතු ප්‍රමාණයක් සිටින බව විවිධ වාර්තා මගින් පෙන්වා දී ඇත. ඒ අනුව මෙම අධ්‍යයනය සඳහා මාතෘකාව ලෙස මා තෝරා ගත්තේ **"පාසල් නොයන ළමුන් ප්‍රධාන සමාජ ප්‍රවාහයට අනුගත කිරීම පිළිබඳ සමාජ විද්‍යාත්මක විමර්ශනයක්"** වශයෙනි. එය කොළඹ දිස්ත්‍රික්කයේ නුගේගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් 514 සී ඔබේසේකරපුර ග්‍රාම නිලධාරී වසම ඇසුරින් සිදු කළ අධ්‍යයනයක් වේ.

## 1.1.2 ශ්‍රී ලංකාවේ පාසල් නොයන ළමයින්ගේ ස්වභාවය.

එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් 1989 වසරේ දී සම්මත කර ගන්නා ලද අතර, 1991 වසරේ දී ශ්‍රී ලංකා රජය ද එය පිළිගන්නා ලදි. මෙම ප්‍රඥප්තියෙන් ළමා වියේ වැදගත්කම අවධාරණය කරන අතර, වඩාත් ආරක්ෂා සහිත ජීවිතයක් සඳහා ළමුන්ට හිමි අයිතිවාසිකම් එහි අවධාරණය කර ඇත. ඒ අනුව එම ප්‍රඥප්තියේ 28 වන ව්‍යවස්ථාව අධ්‍යාපනය ලබා ගැනීමට ඇති මූලික අයිතිවාසිකම් ගැන විග්‍රහ කර ඇත. එනම්,

x ප්‍රාථමික අධ්‍යාපනය අනිවාර්ය කිරීම හා සැම දෙනාට ම නොමිලේ ලබා ගත හැකි වීම.

x ද්විතියික අධ්‍යාපනය නංවාලීමට උනන්දු කිරීම.

x අධ්‍යාපනය හා වෘත්තීය තොරතුරු සියලු ම ළමයින්ට ලබා ගැනීමට හා ඒ සඳහා ප්‍රවේශය ලබා ගැනීමට සැලැස්වීම.

x පාසල්වලට විධිමත් ලෙස පැමිණීමට උනන්දු කර ලීම හා පාසල් හැරයන්නන්ගේ සංඛ්‍යාව අඩු කරලීමට පියවර ගැනීම (යුනිසෙෆ් 1993 : 08) වශයෙනි.

දකුණු ආසියාතික රටවල් හා සසඳන විට ශ්‍රී ලංකාවේ ප්‍රාථමික අධ්‍යාපන අවශ්‍යතා සඳහා යොමු වන ළමයින්ගේ ප්‍රතිශතය ඉහළ අගයක් ගන්නා බව සාමාන්‍යයෙන් විශ්වාස කරන තත්ත්වයකි. එසේ වුව ද සැලකිය යුතු ළමයින් ප්‍රමාණයක් කිසිදා පාසල්වලට ඇතුළත් නොවන බවත්, පාසලට ඇතුළත් වුව ද අතර මග දී පාසලින් විපතනය (Dropout) වන බවත් දක්නට ඇති සුලබ තත්ත්වයකි. ආර්ථික, සමාජයීය හා වෙනත් හේතූන් මෙම ගිලිහීම්වලට බලපා ඇති බව විවිධ වාර්තා මගින් පෙන්වා දී ඇත (අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය 2002 : 10).

දිළිඳුකම ප්‍රධාන වශයෙන් අධ්‍යාපනය හා වෙළී පවතින බැවින් පාසල් නොයන ළමුන් බොහොමයක් ඉන් පීඩා විඳින තත්ත්වයක් තුළ අධ්‍යාපනයට කෙසේ හෝ යොමු කළ ද දිගු කාලීන ව රඳවා තබා ගත නොහැකි වී ඇත. ඉගැන්වීම, ජීවත්වීමට ඉගැන්වීමක් විය යුතු ය. මෙම තත්ත්වය අප රටේ සිදු නොවීම නිසා යුනෙස්කෝව අධ්‍යාපනය සම්බන්ධ ව අප හා තිබූ බැඳීම අඩු විය (ධර්මසේන 2003 : 14).

එක් පැත්තකින් විවිධ හේතූන් නිසා පාසල් වැසී යාමේ ප්‍රවනතාවය ද ශ්‍රී ලංකාවේ මෑත කාලීන ව සිදු වන තත්ත්වයකි. මේ තත්ත්වය තුළ ද පාසල් නොයන ළමයින්ට අධ්‍යාපන අවස්ථාවන් අහිමි විය හැක. අනෙක් අතට පාසල් නොයැමට බලපා ඇති හේතුවලට විසඳුම් දීම මිස ඵලයට විසඳුම් දීම සුදුසු නැත. ඉන් තාවකාලික ව ගැටළුව විසඳෙන අතර නැවත දරුවන් පාසල් නොයන තත්ත්වයේ ම සිටිය හැක. එබැවින් ඔවුන් මුහුණ දෙන ගැටළුවල ස්වභාවය හඳුනාගෙන විසඳුම් දිය යුතු ය.

තව දුරටත් පාසල් නොයන ළමයින් පිළිබඳ ව සොයා බලන විට 1991 වසරේ අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය (2001) මගින් සකස් කළ ශ්‍රී ලංකාවේ ළමයින් පිළිබඳ ක්‍රියාකාරී සැලැස්මට අනුව වයස අවුරුදු 15 ට අඩු ළමයින් ලක්ෂ 05 ක් පමණ ළමා ශ්‍රමිකයින් සේ කටයුතු කරන බවත්, ඉන් 10,000 ක් පමණ ජීවත් වන්නේ මහ මග බවත්